
# ආඩම්බර ජම්බු ගහ



දිමන්සා තෙනුසරි එදිරිසිංහ

# ආඩම්බර ජම්බු ගස

## දිමන්සා තෙනුසරි එදිරිසිංහ

කතා

පළමු දිගහැරුම

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය C

චිත්‍ර නිර්මාණය : දිමන්සා තෙනුසරි එදිරිසිංහ

කෘතිය පළ කරන දිනය : 2026.05.10

ISBN අංකය : 978-624-208-952-2

# පිදුම

"අ" යනු "ආ" යනු මුලින්ම කියා දුන්
මගේ ආච්චීටත්,
මහාමායා මව් තුරුළට ආ දිනේ පටන්
මට ගුරුහරු කම් දෙන,
මෙම ග්‍රන්ථය රචනා කිරීමට මා දිරිගැන්වූ
තමිලා කරුණාරත්න ගුරු මෑණියන්ට හා
මහාමායා විදු මෑණියන්ටත්,
සෙවනැල්ලක් සේ නිරතුරුව මා අසල රැඳෙමින්
මට ශක්තියක් වන
මගේ ආදර අම්මා සහ අප්පච්චීටත්,
පොත් වලට ආදරේ කරන
මගේ පුංචි යාළුවන්ටත්,
ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන “**හේමමාලා උපහාර ගත් කරණ**” ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක්, සන්නිවේදන නිපුනතා, සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුලින්, ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය, කන්ද උඩරටට අගයක් එකතු කළ, ශ්‍රී දළදා වහන්සේ වැඩමකරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල
දියවඩන නිලමේ
ශ්‍රී දළදා මාලිගාව
2026-05-10

එක කැලෑවක ගස් අතරේ අඹ ගහකුයි ජම්බු ගහකුයි තිබුණා.



මේ ජම්බු ගහ එයාගේ අතුවල කුරුල්ලෝ වහනවට කැමති වුණේ නෑ.




ඒ වගේ ම ලේන්නු
වගේ සත්තු ගහේ අතු
වල ඉන්නවට ජම්බු ගහ
කැමති වුනෙත් නෑ.






ජම්බු ගහ එයාගේ රස
ජම්බු කවුරුත් කනවට
කැමති වුණෙත් නැහැ.
ඒකට හේතුව වුණේ ,
“ මගේ කොණ්ඩෙ කැත
වෙයි” කියලා ජම්බු ගහ
හැම වෙලේම හිතුව
නිසයි.


ඒත් අඹ ගහ නම්
එහෙම හිතුවේ නෑ.



ඒ හින්දම කුරුල්ලෝ,
ලේන්නු වගේ සත්තු අඹ
කන්න හැම වෙලේම අඹ
ගහට ආවා.



මී මැස්සෝ රංචුවක් මී වදයකුත් අඹ ගහේ බැඳලා තිබුණා.



ඔන්න එක දවසක් අඹ
ගහ ජම්බු ගහට කතා
කළා.





“ යාළුවේ, ඔයා
ඔහොම හැසිරෙන්න
එපා. අපිට කොණ්ඩයක්
නැහැනේ. අපිට
තියෙන්නේ කොළ.” අඹ
ගහ ජම්බු ගහට කිව්වා.

අඹ ගහ එහෙම කියපු
නිසා, ජම්බු ගහ අඹ ගහ
එක්ක තරහා වුණා.



දවසක් ගස් කපන
මිනිස්සු දෙන්නෙක්
කැලයට ඇවිත් කැලේ
තියෙන ගස් ටිකෙන් ටික
කපන්න පටන් ගත්තා.



ඔහොම ගස් කපා
ගෙන යද්දි ගස් කපන
මිනිස්සු දෙන්නා අර අඹ
ගහයි ජම්බු ගහයි දැක්කා.





“මේ අඹ ගහේ නම්
අඹ ගෙඩි පිරිලා.
කුරුල්ලෝ, ලේන්නු හරි
හරියට ඉදුණු අඹ කනවා.
මීපැණි පිරුණු මී
වදයකුත් තියෙනවා.”
එක් මනුස්සයෙක් අනිත්
මනුස්සයාට කිව්වා.



ගස් කපන්න ආව
මිනිස්සු දෙන්නත් අඹ
කඩා ගෙන කෑවා. “ මේ
අඹ නම් හරිම රසයි. අපි
මේ අඹ ගහ නොකපා
ඉමු.” එක මනුස්සයෙක්
අනිත් මනුස්සයාට
කියද්දි, අනිත්
මනුස්සයාත් ඒ අදහසට
කැමති වුණා.


මේ ජම්බු ගහේ රතු
පාටට ඉදුණු ජම්බු පිරිලා
තිබ්බත් එක කුරුල්ලෙක්
වත් ජම්බු කන්න එන්නේ
නැත්තේ රස නැති නිසා
වෙන්න ඇති කියලා
හිතලා ඒ මිනිස්සු ජම්බු
ගහ කැපුවා.



ජම්බු ගහ හොඳටම
ඇඬුවා. අඹ ගහටත්
ගොඩාක් දුක හිතුණා.



අපිට තියෙන දේවල්
අපි අන් අය සමඟ බෙදා
හදා ගන්න පුරුදු වෙන්න
ඕනේ. කවදාවත් අපි ළඟ
තියෙන දෙවල් ගැන
හිතලා ආඩම්බර වෙන්න
හොඳ නැහැ.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට  අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපතද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත්, යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට, ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියළු දෙනාටද, දියවඩන නිළමතුමන් ඇතුළු ශ්‍රී දළදා මාළිගාවේ කාර්යය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-208-952-2